// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2079/2 - 2018 ජූලි මස 09 වැනි සඳුදා - 2018.07.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### සුරාබදු ආඥාපනත

### සුරාබදු නිවේදනය

සංශෝධනය කරන ලද පරිදි සුරාබදු ආඥා පනතේ (52 වන අධිකාරය වූ) 32 වැනි වගන්තිය සමග කියවිය යුතු 25 වන වගන්තිය යටතේ ගරු මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, 2018 අප්‍රේල් මස 16 වන දින සිට ක්‍රියාත්මක වන ලෙස පහත දැක්වෙන පරිදි ගස් මැදීමේ බලපත්‍ර ගාස්තු සංශෝධනය ඇතුළත් අංක 2066/2 දරන 2018.04.09 දිනැති *ගැසට් නිවේදනය* 2018 ජුනි 21 දින පාර්ලිමේන්තුවේ සම්මත වූ බවට මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආර්. එච්. එස්. සමරතුංග
ලේකම්
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

2018 ජූලි මස 09 වැනි දින,
කොළඹ 01,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ දී ය.

**ගස් මැදීමේ බලපත්‍ර ගාස්තු**

| | | *සමුපකාර ක්‍රමය යටතේ (රු.)* | *සමුපකාර ක්‍රමය යටතේ නොවන (රු.)* |
|---|---|---|---|
| I. | පිරිමි තල් (ගසකට) | 10.00 | 25.00 |
| II. | ගැහැණු තල් (ගසකට) | 25.00 | 50.00 |
| III. | පොල් (ගසකට) | 25.00 | 50.00 |

2.
I. මී රා සඳහා පොල් ගස් මැදීමේ ගෘහස්ථ බලපත්‍රය (ගසකට) ඃ රු. 50.00
II. මී රා සඳහා පොල් ගස් මැදීමේ වාණිජ බලපත්‍රය (ගසකට) ඃ රු. 100.00

3. *අර්ථ නිරූපණය ඃ* ''සමුපකාර ක්‍රමය යටතේ'' යන්න පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි සමුපකාර සමිති හෝ සංගම් අදහස් වේ.

08 - 306

1A - PG 4136 — 77 (2018/07) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*